79966

OL/2021(2022)/60-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)**
**General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)**

| | | |
|---|---|---|
| **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** | **I, II** | **පැය තුනයි** |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies | I, II | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්බර ප්‍රාදේශීය රෝහලේ, දුම්බර පොලිස් ස්ථානයේ සහ සකසුරුවම් හා ණය සමුපකාර සමිතියේ මානව සම්පත් දායකත්වයෙන් ද ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණුගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ද 'ඩෙංගු වළක්වා ගනිමු' යන මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දුම්බර මහා විද්‍යාලයේ දී පවත්වන ලදී. එම වැඩසටහනට දුම්බර මහා විද්‍යාලයේ හා මැදලන්ද විද්‍යාලයේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් සහභාගී විය.

**1.** ඉහත සිද්ධියේ ඇතුළත් 'ඩෙංගු වළක්වා ගනිමු' යන දැනුවත් කිරීමේ වැඩසටහන මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(1) සෞඛ්‍යය (2) අධ්‍යාපනය (3) ආරක්ෂාව (4) විනෝදය

**2.** දුම්බර මහා විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ,

(1) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(2) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා දෙමාපියන් ය.
(3) මැදලන්ද විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(4) මැදලන්ද විද්‍යාලයේ ගුරුවරුන් හා දෙමාපියන් ය.

**3.** ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයක් වන්නේ,

(1) දුම්බර ප්‍රාදේශීය රෝහල ය. (2) සකසුරුවම් සහ ණය සමුපකාර සමිතිය ය.
(3) දුම්බර මහා විද්‍යාලය ය. (4) දුම්බර පොලිස් ස්ථානය ය.

**4.** දුම්බර ප්‍රාදේශීය රෝහල,

(1) ඖෂධ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
(3) සේවා සපයන ව්‍යාපාරයකි. (4) පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

**5.** ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන 'ව්‍යවසායකත්වය' සඳහා නිදසුනක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදිත සඳහා භාවිත කරන රබර් (2) ව්‍යාපාරයට යොදවා ඇති මුදල්
(3) ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණු (4) ව්‍යාපාරයේ සේවකයින්

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**14.** විකුණුම් කළමනාකරු විසින් 2021 වර්ෂයේ විකුණුම් ඇගයීමට ලක් කිරීම කළමනාකරණ ක්‍රියාවලියේ ......①...... ට අයත් වන අතර, 2022 වර්ෂයේ දී 5% ක වට්ටමකට යටත් ව භාණ්ඩ විකිණීම, අලෙවිකරණ මිශ්‍රයේ ......②...... විචල්‍යයට අයත් වේ.

ඉහත ① හා ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාලනය, ප්‍රවර්ධනය (2) සැලසුම්කරණය, මිල
(3) සැලසුම්කරණය, ප්‍රවර්ධනය (4) පාලනය, මිල

**15.** රංග විසින් උපයාගත් රු. 250 000 ක මුදල සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කළේ ය. 2021 වර්ෂයේ එම සමාගම ඉපැයූ ලාභයෙන් රු. 10 000 ක් ඔහුට හිමි විය. පසුව සියලු කොටස් රු. 350 000 කට විකුණන ලදී. මෙම ආයෝජනයෙන් රංග උපයාගත් ප්‍රතිලාභ හැඳින්වෙන යෙදුම් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පොලී ආදායම්, ලාභාංශ (2) ලාභාංශ, ප්‍රාග්ධන ලාභ
(3) ලාභ, ප්‍රාග්ධන ලාභ (4) ප්‍රාග්ධන ලාභ, පොලී ආදායම්

**16.** නිශ්චිත ප්‍රතිලාභ අනුපාතයක් රහිත ආයෝජන මාර්ගය කුමක් ද?

(1) ස්ථාවර තැන්පතු (2) භාණ්ඩාගාර බිල්පත්
(3) ඉතිරිකිරීමේ තැන්පතු (4) සාමාන්‍ය කොටස්

**17.** ද්විත්ව සටහන් මූලධර්මය අනුව අඩුවීම හර, වැඩිවීම බැර ලෙස සටහන් කෙරෙන ගිණුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ණයහිමි ගිණුම, ගැනිලි ගිණුම, විකුණුම් ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම
(2) බැංකු ණය ගිණුම, ණයහිමි ගිණුම, දුන් වට්ටම් ගිණුම, කොමිස් ආදායම් ගිණුම
(3) වැටුප් ගිණුම, ණයගැති ගිණුම, වේතන ගිණුම, මුදල් ගිණුම
(4) ප්‍රාග්ධන ගිණුම, ණයහිමි ගිණුම, බැංකු ණය ගිණුම, ලද වට්ටම් ගිණුම

**18.** ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක ජංගම නොවන වත්කමක් වන්නේ,

(1) ලැබිය යුතු ගොඩනැගිලි කුලී ය. (2) විකිණීමට තබා ඇති ලී බඩු ය.
(3) වඩු මේසය ය. (4) අතැති මුදල් ය.

- පහත තොරතුරු ඇසුරෙන් අංක **19** සිට **21** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A – රු. 25 000 ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
B – රු. 10 000 කට මිල දී ගත් බඩු තොගයක් රු. 12 000 ට ණයට විකිණීම
C – ණයගැතියකුගෙන් රු. 5 000 ක මුදලක් ලැබීම
D – ව්‍යාපාරයේ කාර්යාලයට රු. 50 000 ක මේසයක් ණයට ගැනීම

**19.** ඉහත ගනුදෙනු අතුරෙන් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි හිමිකම කෙරෙහි බලපාන ගනුදෙනුව වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**20.** ඉහත ගනුදෙනුවලින් පසු මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි වත්කම්වල අගය වැඩි වන්නේ

(1) රු. 15 000 කිනි. (2) රු. 17 000 කිනි.
(3) රු. 52 000 කිනි. (4) රු. 92 000 කිනි.

**21.** ඉහත ගනුදෙනුවලට පෙර මෙම ව්‍යාපාරයේ මුළු වගකීම් රු. 80 000 ක් වූයේ නම්, මෙම ගනුදෙනුවලින් පසු මුළු වගකීම්වල අගය කොපමණ ද?

(1) රු. 75 000 (2) රු. 90 000 (3) රු. 130 000 (4) රු. 142 000

**22.** භාවිත කළ කාර් රථ මිල දී ගෙන විකුණන ව්‍යාපාරයක්, රු. 2 000 000 කට කාර් රථයක් විකිණීම සඳහා ණයට ගැනීම සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙළින්,

(1) ගෙවීම් වවුචරය සහ ගැනුම් ජර්නලයයි. (2) ජර්නල් වවුචරය සහ පොදු ජර්නලයයි.
(3) ගැනුම් ඉන්වොයිසිය සහ පොදු ජර්නලයයි. (4) ගැනුම් ඉන්වොයිසිය සහ ගැනුම් ජර්නලයයි.

**23.** ණයගැතියකු වූ රවීගෙන් ලැබුණු රු. 15 000 ක චෙක්පත, ව්‍යාපාරයේ ලෙජරයේ සටහන් කර ඇත. එම චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කරන විට තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) බැංකු ගිණුම හර රු. 15 000
මුදල් ගිණුම බැර රු. 15 000

(2) බැංකු ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000

(3) මුදල් ගිණුම හර රු. 15 000
බැංකු ගිණුම බැර රු. 15 000

(4) මුදල් ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**30.** සමගි ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 100 ක් සිටින අතර එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජිකයින් 70 දෙනෙකුගේ වාර්ෂික සාමාජික මුදල් ලැබී ඇත. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු සාමාජික මුදල් ආදායම වන්නේ,

(1) රු. 3 500 කි. (2) රු. 5 000 කි. (3) රු. 42 000 කි. (4) රු. 60 000 කි.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කේක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2022.03.31 දිනෙන් අවසන් මාසය තුළ කේක් කිලෝග්‍රෑම් 1 000 ක් නිපදවීම සඳහා දරන ලද වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තිරිඟු පිටි ............................ | 100 000 |
| බිත්තර ................................ | 10 000 |
| අනෙකුත් ද්‍රව්‍ය ....................... | 20 000 |
| කේක් සාදන්නාගේ වැටුප ........... | 45 000 |
| ව්‍යාපාරයේ බදු කුලිය (මාසික) ....... | 10 000 |
| ව්‍යාපාරයේ විදුලි බිල (මාසික) ....... | 15 000 |

**31.** 2022.03.31 දිනෙන් අවසන් මාසය සඳහා කේක් නිෂ්පාදනයට අදාළ ප්‍රාථමික පිරිවැය වන්නේ,

(1) රු. 145 000 කි. (2) රු. 155 000 කි. (3) රු. 175 000 කි. (4) රු. 200 000 කි.

**32.** 10% ක ලාභාන්තිකයක් තබා ගන්නේ නම්, කේක් කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල කොපමණ ද?

(1) රු. 143.00 (2) රු. 192.50 (3) රු. 200.00 (4) රු. 220.00

● පහත තොරතුරු ඇසුරෙන් අංක **33** හා **34** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුලෝචනගේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ මසකට රු. 10 000 බැගින් කුලී ගෙවන ගොඩනැගිල්ලක ය. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 80 000 ක් ගෙවා ඇත.

**33.** සුලෝචනගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ගැළපීමට අදාළ ජර්නල් සටහන තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 40 000 | |
| | ගෙවිය යුතු කුලී ගිණුම | | | රු. 40 000 |
| (2) | ලැබිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 40 000 | |
| | ගොඩනැගිලි කුලී ආදායම් ගිණුම | | | රු. 40 000 |
| (3) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 80 000 | |
| | මුදල් ගිණුම | | | රු. 80 000 |
| (4) | ගොඩනැගිලි කුලී ගිණුම | හර | රු. 120 000 | |
| | ගෙවිය යුතු ගොඩනැගිලි කුලී ගිණුම | | | රු. 120 000 |

**34.** සුලෝචනගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගොඩනැගිලි කුලිය ඇතුළත් කළ යුතු වන්නේ,

(1) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 40 000 ක් ලෙස ය.
(2) ලැබිය යුතු ගොඩනැගිලි කුලිය රු. 40 000 ක් ලෙස ය.
(3) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 80 000 ක් ලෙස ය.
(4) ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 120 000 ක් ලෙස ය.



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**60 S I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
## General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II |
| Business and Accounting Studies | I, II |

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කළමනාකරණ උපාධිධාරියකු වූ අවදානම් දැරීමට කැමති සුහවාදී අදහස් දරන දිවාන්, සංචාරක පාරාදීසයක් වූ කොග්ගල ග්‍රාමයේ වාසය කරයි. ඔහු මඩොල්දූව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට කොග්ගල වැව හරහා මඩොල්දූවට යාම සඳහා බෝට්ටු සේවා සැපයීමට 'ගඟුලි සෆාරි' නමින් ව්‍යාපාරයක්, තමා සතු රු. 800 000 ක මුදල ද, වාර්ෂිකව 12%ක පොලියට රු. 500 000 ක බැංකු ණයක් ද යොදවා 2022.01.01 දින ආරම්භ කළේ ය. එදින ම ඔහු රු. 800 000 කට සෆාරි බෝට්ටුවක් ද රු. 120 000 කට ආරක්ෂිත ඇඳුම් කට්ටල ද අත්පිට මුදලට ගත් අතර, රු. 35 000 ක මාසික වැටුපකට පළපුරුදු බෝට්ටු රියදුරකු වූ තිලක් ද, රු. 10 000 ක මාසික වැටුපකට නුපුහුණු සේවකයකු වූ කුමාර ද බඳවා ගත්තේ ය. එදින ම සංචාරක නිකේතන බහුලව පිහිටි මඩොල්දූවට ඉතා නුදුරින් ව්‍යාපාරික ස්ථානය සඳහා ගොඩනැගිල්ලක් මසකට රු. 7 000 ක කුලී පදනම මත ලබා ගන්නා ලදී.

2022.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| • ගෙවූ ඉන්ධන වියදම් ............................................ | 85 000 |
| • ගෙවූ රක්ෂණ ගාස්තු ............................................ | 8 000 |
| • ගෙවූ තොටුපළ ගාස්තු ............................................ | 15 000 |
| • ගෙවූ වෙනත් වියදම් ............................................ | 20 000 |
| • ලැබූ මුළු බෝට්ටු සේවා ආදායම ............................ | 310 000 |

ජනවාරි මාසයේ ව්‍යාපාරයේ ආදායම් හා වියදම් විශ්ලේෂණය කිරීමෙන් පසු, පෙබරවාරි මාසයේ සිට තවත් සෆාරි බෝට්ටු දෙකක් ණය පදනම මත ලබාගෙන ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට දිවාන් තීරණය කර ඇත.

**අමතර තොරතුරු :**

* සෆාරි බෝට්ටුව වාර්ෂිකව 12% බැගින් සහ ආරක්ෂක ඇඳුම් කට්ටල වාර්ෂිකව 50% බැගින් ක්ෂය කළ යුතු ය.
* ජනවාරි මාසයේ විදුලි බිල රු. 1 000 කි. එය 2022.01.31 දින වන විටත් ගෙවා නොමැත.
* ජනවාරි මාසයට අදාළ, බෝට්ටු රියදුරු සහ නුපුහුණු සේවක වැටුප ජනවාරි මාසය තුළ දී ගෙවා ඇති අතර, ගොඩනැගිලි කුලිය 2022.01.31 දින තෙක් ගෙවා නොමැත.

(i) (අ) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) ව්‍යාපාර හිමිකාරත්වය අනුව 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ, ව්‍යාපාර පරිසර සාධක පහක් පහත දැක්වේ.

(අ) කොග්ගල සංචාරක පාරාදීසය
(ආ) දිවාන්ගේ කළමනාකරණ උපාධිය
(ඉ) පළපුරුදු බෝට්ටු රියදුරු, තිලක්
(ඊ) නුපුහුණු සේවක, කුමාර
(උ) ව්‍යාපාර ස්ථානයට නුදුරින් පිහිටි මඩොල්දූව

ඉහත එක් එක් ව්‍යාපාර පරිසර සාධකය 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයට ශක්තියක් ද, දුර්වලතාවක් ද, අවස්ථාවක් ද, තර්ජනයක් ද යන්න දක්වන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න. පළමු පරිසර සාධකය (අ) සඳහා පිළිතුර දී ඇත.)

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**3.** (i) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ දී රේඛනය කිරීම අනිවාර්ය වේ.

(ආ) ජීවිත රක්ෂණය සඳහා හානිපූර්ණ රක්ෂණ මූලධර්මය අදාළ නොවේ.

(ඉ) සන්නිවේදන ක්‍රියාවලියක යවන්නා හා ලබන්නා අතර හුවමාරුවන පණිවුඩය සම්බන්ධ කරනුයේ සන්නිවේදන මාධ්‍යය මගිනි.

(ඊ) බොහෝවිට ගමනාන්තය තෙක් යොදාගත නොහැකි වීම, දුම්රිය මාර්ග ප්‍රවාහනයේ ඇති අවාසියකි. (ලකුණු 02 යි)

(iii) යාපනයේ අර්තාපල් වගා කරන රාජා කොළඹ සුපිරි වෙළඳසැලක් හිමි ප්‍රභාත්ට අර්තාපල් කිලෝග්‍රෑම් 50 ක් සිකුරාදා රාත්‍රී දුම්රියෙන් කොටුව දුම්රිය ස්ථානය වෙත එවන බව දුරකථනයෙන් දැනුම් දෙන ලදී. ප්‍රභාත් එම අර්තාපල් තොගය භාර ගැනීමට එකඟ වී රාජාට දන්වා තම ලොරි රථයේ රියදුරුට හා සේවකයකුට කොටුව දුම්රිය ස්ථානයට යන මෙන් දන්වන ලදී.

(අ) ඉහත සිද්ධියේ ඇතුළත් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් වන ප්‍රතිචාරය සඳහා නිදසුනක් ලියන්න.

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් සිල්ලර වෙළෙන්දා හා තොග වෙළෙන්දා වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) ජගත් ව්‍යායාම මංතීරුවේ ඇවිදිමින් සිටිය දී රු. 500 000 ක වටිනාකමකින් යුත් බිම වැටී තිබුණු මහජන බැංකුවේ චෙක්පතක් ඇහිඳ ගනු ලැබී ය. එම චෙක්පතේ මුහුණත 'රුවන් පෙරේරා' යන නම ලියා තිබූ අතර 'ආදායකයාගේ ගිණුමට පමණයි, ලංකා බැංකුව' යන යෙදුම සමාන්තර රේඛා දෙකක් අතර ලියා තිබුණි.

(අ) මෙම චෙක්පතෙහි අණලදු සහ ආදායකයා වෙන වෙන ම නම් කරන්න.

(ආ) මෙම චෙක්පතෙහි වටිනාකම බැංකු කවුන්ටරයෙන් මුදල් කර ගැනීමට කිසිදු පාර්ශ්වයකට නොහැකි ය. ඊට හේතුව කුමක් ද? (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**4.** (i) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සැලසුම් කරන ලද ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත නිසි ලෙස හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.

(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය මෙන් ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

(ඉ) පුද්ගලයකු උපයාගත් ආදායමෙන් ඉතිරි කරගත් මුදලක්, යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනය වේ.

(ඊ) රජය වෙනුවෙන් වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලැබේ. (ලකුණු 02 යි)

(iii) දසුන් තම කිතුල් හකුරු නිෂ්පාදන පිටකොටුව දුම්රිය ස්ථානය අසල විශේෂ වට්ටමක් සහිත ව සේවකයින් තිදෙනෙකු සමග අලෙවි කරන අතර, එක් එක් සේවකයා ඉටු කළ යුතු කාර්ය පිළිබඳ ව උපදෙස් දෙන ලදී. ඉහත සිද්ධිය ඇසුරෙන්,

(අ) කළමනාකරණ කාර්යයක් වන මෙහෙයවීම සඳහා නිදසුනක් ලියන්න.

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන මිල සඳහා නිදසුනක් ලියන්න. (ලකුණු 02 යි)

(iv) අමල් සහ සමන් යන අයට ලොතරැයි දිනුමක් හිමි වී ඇති අතර ඔවුන් දෙදෙනා එය සම සමව බෙදා ගන්නා ලදී. අමල් තමාට ලද මුදලින් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කර ඉතිරි මුදලින් ඉඩමක් මිල දී ගන්නා ලදී. සමන් තමාට ලද මුදලින් අඩක් කොළඹ කොටස් වෙළෙඳපොළේ සීමිත පොදු සමාගමක කොටස් මිල දී ගැනීමට යෙදු වූ අතර ඉතිරිය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කරන ලදී.

ඉහත සිද්ධියට අදාළ ව,

(අ) ප්‍රතිලාභයක් ලෙස පොලී ආදායමක් ලබන්නේ කවුරුන් ද?

(ආ) අමල් සහ සමන් යන දෙදෙනාට ම ලැබිය හැකි ප්‍රතිලාභයේ නම කුමක් ද? (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

[දහවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**6.** (i) ප්‍රාථමික පිරිවැයේ මූලිකාංග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිමල් කැන්වස් රෙදිවලින් බෑග් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් 2022.01.01 දින ආරම්භ කර, ඒ සඳහා රු. 120 000 ක් වටිනා යන්ත්‍ර උපකරණ මිලට ගන්නා ලදි. ජනවාරි මාසයේ නිෂ්පාදන වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ගොඩනැගිලි කුලී ..................... | 20 000 |
| බෑග් මසන්නන්ගේ වැටුප් ............ | 60 000 |
| මුරකරු වැටුප ........................ | 25 000 |
| කැන්වස් රෙදි මිලට ගැනුම් ......... | 200 000 |
| බෑග් මෝස්තර නිර්මාණ වියදම් ...... | 30 000 |
| විදුලි වියදම .......................... | 8 000 |
| යන්ත්‍ර අලුත්වැඩියා වියදම් ............ | 14 000 |
| යන්ත්‍ර ක්ෂය .......................... | 3 000 |

ජනවාරි මාසය අවසානයේ ඉතිරි කැන්වස් රෙදි කිසිවක් නොමැති අතර, කැන්වස් බෑගයක පිරිවැය රු.1200 කි.

**අවශ්‍ය වන්නේ :**

ජනවාරි මාසයේ කැන්වස් රෙදි බෑග් නිෂ්පාදනයට අදාළ,

(අ) ප්‍රාථමික පිරිවැය

(ආ) පොදුකාර්ය පිරිවැය (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරය විසින් 2022.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| මුදල් ශේෂය ................. | 110 000 | |
| විකුණුම් ..................... | | 540 000 |
| ගැනුම් ........................ | 300 000 | |
| දුරකථන ගාස්තු ............... | 8 000 | |
| වරිපනම් ගාස්තු ............... | 2 000 | |
| මෝටර් රථය .................. | 250 000 | |
| ඉඩම් හා ගොඩනැගිලි ...... | 800 000 | |
| ණයහිමියෝ ................. | | 60 000 |
| ප්‍රාග්ධනය ..................... | | 900 000 |
| අවිනිශ්චිත ගිණුම ........... | 30 000 | |
| | 1 500 000 | 1 500 000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී හඳුනාගත් ගිණුම්කරණ වැරදි පහත දැක්වේ.

(අ) ගෙවූ දුරකථන ගාස්තු රු. 6 000 ක් දුරකථන ගාස්තු ගිණුමේ රු. 8 000 ක් ලෙස සටහන් කර තිබීම

(ආ) ණයහිමියන්ට ගෙවූ රු. 16 000 ක් අදාළ ණයහිමි ගිණුමට බැර කර තිබීම

(ඉ) ගෙවූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 100 000 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුම

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් (ලකුණු 04 යි)

(iv) 2022.03.31 දිනට ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 24 000 ක් විය. නමුත් එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙයට වෙනස් විය. පසුව වෙනසට හේතු ලෙස පහත සඳහන් කරුණු අනාවරණය විය.

- බැංකුව විසින් ගයාන්ගේ ජංගම ගිණුමේ සටහන් නොකරන ලද චෙක්පත් :
  - තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 14 000 ක චෙක්පත
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ රු. 15 000 ක චෙක්පත
- ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ ගනුදෙනු :
  - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ ණය වාරිකය රු. 10 000
  - සෘජුවම බැංකුවට ලැබූ ණයගැති ප්‍රේෂණ රු. 30 000

**අවශ්‍ය වන්නේ :**

(අ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[දොළොස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka